**හම්බන්තොට මහා නගර සභාව**

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින නගරාධිපති ඇතුළු සභිකවරුන් වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඉටුකරන ලද කර්මාන්ත 05 කට අදාළව ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් සඳහා රු. 1,091,129 ක ණයගැති ප්‍රතිපාදන හා රු. 1,030,638 ක ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පිරිවැය රු. 826,880 ක් වූ සහ අපහරණය කරන ලද රු. 116,860 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල වටිනාකම් ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි.

(ඇ) රු. 438,150 ක් වූ ඉකුත් වර්ෂයේ විගණන ගාස්තු සහ සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ගෙවන ලද රු. 153,523 ක් වූ වියදම් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ලීටර 2,000 ජල ටැංකි 04 ක හා පෙර පාසල් උපකරණවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 1,523,593 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

2016 වර්ෂයට පෙර සිට හිඟව පවතින රු. 68,000 ක් වූ වෙළඳ බලපත්‍ර හා කර්මාන්ත බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

දීර්ඝ කාලයක සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව ඇති රු. 6,284,777 ක් වූ දායක මුදල ගෙවා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 14,023,911 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම්**

-----------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ වාහන 11 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) | 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම නිසා වීථි පහන් නඩත්තුව සඳහා දරන ලද වියදමින් සියයට 12 කට ආසන්න ප්‍රතිශතයකින් පමණක් ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ඇ) හා 2.6.1 (ii) ඡේද | තොරතුරු කළමනාකරණ පද්ධතිය මිලට ගැනීම සඳහා පිරිවිතර සැකසීමේදී හා අනුමත කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

**1.3.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

**----------------------------------**

අයවැයගත ප්‍රතිපාදනය ඉක්මවා සැපයුම් හා උපකරණ වැය විෂයය සඳහා දරා තිබුණු රු.98,239 ක වියදම් පියවා ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 216 වගන්තියෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,179,128 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,253,528 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 6,877,000 | 7,166,642 | 6,028,788 | 2,050,078 | 6,633,240 | 6,777,418 | 5,469,913 | 2,370,439 |
| ii කුලී | 15,421,000 | 18,598,220 | 18,347,680 | 545,273 | 14,481,200 | 15,410,621 | 14,689,102 | 736,961 |
| iii බලපත්‍ර ගාස්තු | 2,492,000 | 4,117,732 | 4,005,995 | 584,950 | 2,280,000 | 2,545,968 | 2,188,964 | 514,153 |
| iv වෙනත් ආදායම් | 7,552,000 | 7,187,906 | 4,885,463 | 3,491,917 | 6,676,000 | 8,031,036 | 6,383,138 | 4,179,750 |
| එකතුව | 32,342,000 | 37,070,500 | 33,267,926 | 6,672,218 | 30,070,440 | 32,765,043 | 28,731,117 | 7,801,303 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**------------------------------------**

සමාලෝචිත වර්ෂයට බිල්කළ මුළු ආදායම රු. 37,070,500 ක් වූ අතර, වර්ෂය තුළදී ඉන් රු. 33,267,926 ක් රැස්කර තිබුණි. වර්ෂය අවසානයට හිඟය රු. 6,672,218 ක් විය.

**2.2.3 වරිපනම්**

**---------**

මහා නගර සභා ආඥා පනතේ 252(1) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට රු. 2,013,578 ක වරිපනම් බදු හිඟව පැවති අතර, 2018 ජුනි මාසය වන විට ඉන් රු. 517,717 ක් අයකර ගෙන තිබුණි.

**2.2.4 කුලී**

-----

(අ) ගිවිසුම් යාවත්කාලීන නොකිරීම

------------------------------------

2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 වන ඡේදයට අනුකූලව සෑම ගිවිසුමක්ම වසර තුනකට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, සභාව සතු පොදු වෙළඳපොල කඩ කාමර 30 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) තක්සේරු කුලී අය නොකිරීම

--------------------------------

ඉහත (අ) ඡේදයෙහි සඳහන් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව නව තක්සේරු කුලිය සභා සම්මත කරගෙන අය කිරීමට කටයුතු කළ යුතු වුවත්, සභාව සතු පොදු වෙළඳපොළ කඩකාමර 34 ට අදාළව 2016 වර්ෂයේ සහ බස් නැවතුම්පොළ උඩු මහල කඩකාමර 16 කට අදාළව 2017 වර්ෂයේ ලබා දී තිබූ තක්සේරු වාර්තා අනුව කුලී අය නොකිරීම නිසා 2018 ජුනි 30 දින වන විට සභා අරමුදලට රු. 1,652,450 ක මුදලක් අහිමි වී තිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

**-----------------**

සභාව සතු වාහන සහ යන්ත්‍රෝපකරණ කුලියට ලබා දීම වෙනුවෙන් රු. 325,920 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට හිඟව පැවතුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු. 597,620 ක් සහ මුද්දර ගාස්තු රු. 1,542,916 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රතිපාදන නොසැලසීම

i. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යන් 06 ක් සඳහා අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

ii. සභා අරමුදල් උපයෝගී කර ඉටු කිරීම සඳහා අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු කර්මාන්ත 12 ක් වර්ෂය තුළදී ඉටු කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2. මානව සම්පත් කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 03 කට අදාළව 46 දෙනෙකුගේ අතිරික්තයක් හා තනතුරු 15 කට අදාළව 22 දෙනෙකුගේ පුරප්පාඩු නිරීක්ෂණය විය.

**3.3 වත්කම් කළමනාකරණය**

**පවරා නොගත් වත්කම්**

මහා නගර සභාව විසින් භාවිතයට ගනු ලබන වාහන 06 ක ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට 2018 මාර්තු 16 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.4 ප්‍රසම්පාදනය**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා මහා නගර සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් ඉටු කරන ලද කර්මාන්ත කිහිපයක් සම්බන්ධයෙන් 2018 මාර්තු 16 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) රාජපක්ෂ මාවත අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇල්ලීම

රු. 1,256,641 ක වියදමින් ඉදි කර තිබූ මෙම මාර්ගයේ බොහෝ ස්ථාන ගිලා බැස තිබුණු අතර, මීටර් 16 ක පමණ ගල්කුඩු යොදා නොතිබුණි.

(ii) මිරිජ්ජවිල මාර්ග අංක 12 සහ 13 අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීම

පිළිවෙලින් රු. 1,520,109 ක සහ රු. 662,272 ක වියදමින් ඉදි කළ මෙම මාර්ගවල බොහෝ ස්ථාන ගිලා බැස තිබුණු අතර, කොන්ක්‍රීට් කැට අතර විශාල පරතරයක් ඇති වන අයුරින් කැට ගල් අල්ලා තිබුණි. මාර්ගය දෙපස කොන්ක්‍රීට් තලය ස්ථාන කිහිපයකින් පුපුරා තිබුණු අතර, ප්‍රමාණවත් පරිදි ගල් කුඩු යොදා නොතිබුණි. තවද මාර්ග පාදම සැකසීමේදී, මාර්ගය අවශ්‍ය පරිදි තලා සකස් කර නොතිබීම නිසා කොන්ක්‍රීට් කුට්ටි ගල් ගිලා බැසීමට ලක්වී තිබුණි.

(iii) රාජපක්ෂ මාවත හරහා බෝක්කුවක් ඉදිකිරීම

බෝක්කුව ඉදිකිරීමේ කටයුතු අතරමඟ නවතා දැමීම නිසා එම ස්ථානයෙහි අනාරක්ෂිත බවක් නිරීක්ෂණය විය. ඇස්තමේන්තුගත පිරිවැය රු. 227,969 ක් වූ මෙම කර්මාන්තයේ ගිවිසුම් කාලය ඉක්මවා මාස 6 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, 2018 ජූනි අවසානය වන විටත් කර්මාන්තයේ කටයුතු නිමකර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ නොවැම්බර් මාසයේදී රු. 938,500 ක් වැයකර මිලට ගෙන තිබුණු තොරතුරු කළමනාකරණ පද්ධතිය සභාවේ කාර්ය සාධනය සඳහා ඵලදායි ලෙස භාවිතා කිරීමට 2018 ජූනි අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. තොරතුරු කළමනාකරණ පද්ධතිය, සේවා සපයන්නාගේ ස(ර්)වරය තුළ ගබඩා කර තිබීම නිසා සභාවේ දත්ත හා තොරතුරු තෙවන පාර්ශවයක් භාරයේ පැවතීම තුළින් ඒවායේ නිවරද්‍යතාවය, රහස්‍යභාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු ඇති විය හැකි බව නිරීක්ෂණය කෙරේ.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(අ) සේවා සඳහා ගාස්තු, සහ ආදායම් ආධාර යන විෂයයන් වල අහිතකර විචලනයන්ගේ එකතුව රු. 18,795,668 ක් වූ අතර, එම වටිනාකම් සියයට 20 ක් හා සියයට 22 ක් විය.

(ආ) වැය විෂයයන් 04 ක ඉතිරි කිරීම්වල එකතුව රු. 1,461,682 ක් වූ අතර, එම වටිනාකම් සියයට 10 සිට සියයට 45 දක්වා පරාසයක විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

------------------------

2014 පෙබරවාරි 14 දිනැති අංක දපප/යහ/01/න.ච.ලේ දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව මහා නගර සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| **පද්ධතිය** | **අඩුපාඩුව** |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් ශේෂ අත්හැරුණු, අඩුවෙන් හා වැඩියෙන් දක්වා ඇති අවස්ථා පැවතීම. |
| | ii. ගිණුම් තැබීමේ අඩුපාඩු නිසා ඉකුත් වර්ෂය වෙනුවෙන් සැලකිය යුතු අගයන්ගෙන් ගැලපීම් කිරීමට සිදුවී තිබීම. |
| | iii. ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණු අවස්ථා පැවතීම. |

| | | |
|---|---|---|
| (ආ) ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් අයකර ගැනීම පහළ මට්ටමක පැවතීම. |
| | ii. | නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා නොගැනීම. |
| | iii. | කඩ කාමර තක්සේරු කුලිය අය නොකිරීම හා ගිවිසුම් යාවත්කාලීන නොකිරීම. |
| (ඇ) සේවක කළමනාකරණය | i. | සේවක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම. |
| | ii. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයන් සේවයේ යෙදවීම. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | i. | ගෙවීම් වාර්තාවල දක්වා තිබූ පරිදි කාර්යයන් ඉටු නොකරන ලද අවස්ථා පැවතීම. |
| | ii. | ගෙවීම් වාර්තා සකස් කිරීමේදී කර්මාන්ත වලට අදාළව ඉටු කළ කාර්යයන් නිවැරදිව දක්වා නොතිබූ අවස්ථා පැවතීම. |
| | iii. | ඉදි කිරීම් කටයුතු වලදී ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුකර නොමැති අවස්ථා පැවතීම. |
| (ඉ) අයවැය පාලනය | i. | නිසි අධ්‍යානයකින් හා ඇගයීමකින් යුතුව ඇස්තමේන්තු සකස් නොකිරීම. |
| | ii. | අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා පසුවිපරම් කටයුතු සිදුකර නොතිබීම. |